# ජනමාධ්‍ය අමාත්‍යාංශයේ
# පිළිගැනීමේ නිලධාරී තනතුරෙහි පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට
# අයදුම්පත් කැඳවීම

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ)

## 01. බඳවා ගැනීමේ සුදුසුකම්

**1.1 අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අ.පො.ස. සා/පෙළ සමත් වී තිබීම.

සහ

අ.පො.ස. උ/පෙළ විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**1.2 වෘත්තීය සුදුසුකම්** : අදාළ නොවේ

**1.3 පළපුරුද්ද** : අදාළ නොවේ

**1.4 කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**1.5 වෙනත්** :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරකට බඳවාගැනීම සඳහා අවශ්‍ය 1.1 සිට 1.6 දක්වා සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**1.6 වයස**

1.6.1 **අවම සීමාව** – අවුරුදු 18 ට නොඅඩු

1.6.2 **උපරිම සීමාව** – අවුරුදු 30 ට නොවැඩි

**සටහන :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගත්තා අයදුම්කරුවන් අතුරෙන් කුසලතාවය අනුව පවතින පුරප්පාඩුවලට බඳවාගනු ලැබේ.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

## 02. බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්

2.1 **ලිඛිත විභාගය** : අදාළ නොවේ

2.2 **වෘත්තීය පරීක්ෂණය** : අදාළ නොවේ

2.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය** : අදාළ නොවේ

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| භාෂා ප්‍රවීනතාවය | 25 | අදාළ නොවේ |
| පරිගණක දැනුම | 15 | අදාළ නොවේ |
| පළපුරුද්ද | 30 | අදාළ නොවේ |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | අදාළ නොවේ |
| **එකතුව** | **100** | **අදාළ නොවේ** |

## 03. වැටුප් පරිමාණය : රු. 27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660 - රු. 45,540/-

## 04. සාවද්‍ය තොරතුරු සැපයීම

මෙම පුරප්පාඩු පිරවීමේදී කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවාගත් පසුවද අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක්, එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහුගේ / ඇයගේ සේවය අවසන් කිරීමටත් රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

## 05. අයදුම්පත්‍ර යොමු කිරීම

තමන් විසින් සකසා ගන්නා ලද අයදුම්පතක් සහ ජීව දත්ත සටහන 2021.05.04 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය, ඇසිදිසි මැදුර, අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන හා තැපෑලේදී සිදුවන ප්‍රමාදයන් සලකා බලනු නොලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි**

**ලේකම්,**
**ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**ඇසිදිසි මැදුර,**
**අංක 163, කිරුළපන මාවත,**
**පොල්හේන්ගොඩ,**
**කොළඹ 05.**

Source: Dinamina (2021.04.20)